**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 01- (ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - ආසියානු සංවර්ධන බැංකුව - ගිවිසුම් අංක2947සහ2948 එස්.ආර්.අයි) - 2024**

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 01 හි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947-එස්.ආර්.අයි සහ අංක 2948- එස්.ආර්.අයි (එස්.එෆ්) දරණ ව්‍යාපෘති ගිවිසුමේ පරිච්ඡේද II හි 2.10(a) වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන ව්‍යාපෘති - 01 හි කාලය

ව්‍යාපෘතියට අනුව සහ වැඩසටහන ව්‍යාපෘති 01 හි ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘති 01 එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ව්‍යාපෘති 01 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ ව්‍යාපෘති 01 හි අරමුණු වනුයේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහ කොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ (අ) කොළඹ නගරයේ ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ පුළුල් කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම (ආ) මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම (ඈ) ආයෝජන වැඩසටහන කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම බලාපොරොත්තුවේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ව්‍යාපෘති 01 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එ.ජ.ඩො. මිලියන 112 ක් වන අතර ඉන් රු.මිලියන 11,088 කට සමාන එ.ජ.ඩො. මිලියන 84 ක් හෝ සියයට 75ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,696 කට සමාන එ.ජ.ඩො. මිලියන 28 ක් හෝ සියයට 25ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කරයි. වැඩසටහන - ව්‍යාපෘති 01 හි කටයුතු 2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව, වැඩසටහන - ව්‍යාපෘති 01 හි කාලපරිච්ඡේදය 2021 ජුනි 30 දක්වා තෙවරක් දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගනණය කල මතය

මෙම වාර්තාවේ 2.1 හි විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2024 දෙසැම්බර් 31 දිනට වැඩසටහන - ව්‍යාපෘති 01 හි මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන හා මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු /විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 හි 39(අ) ඡේදය ප්‍රකාරව, ව්‍යාපෘතියට අදාළ විදේශ ණයට සම්බන්ධ රු.මිලියන 4,853 ක සමානාත්මතා ගැලපුම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | 4,853 | මූල්‍ය ප්‍රකාශනවල කිසිදු සමානාත්මතා ගැලපීමක් සිදු කර නොමැත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | පුනරුත්ථාපන කටයුතුවල භෞතික ප්‍රගතිය සම්පූර්ණයෙන්ම නිම කර 2022 මැයි 23 වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දී තිබුණි. එබැවින්, 2022 ජූනි සිට දෙසැම්බර් දක්වා කාල සීමාවට අදාළ රු.මිලියන 172.70 ක ණය සේවා පිරිවැය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගෙවිය යුතුව තිබුණි. නමුත් එය ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමට ප්‍රාග්ධනීකරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘති යේ වත්කම් එම වටිනාකමින් වැඩියෙන් ප්‍රකාශ කර තිබුණි. | 172.70 | 2023 සහ 2024 වර්ෂ සඳහා දරණ ලද පොලිය තවමත් ව්‍යාපෘති වාර්තාවල ගිණුම්ගත කර නොමැත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |

**2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| | නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 502(2)සහ 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘති කාර්යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රි ලැයිස්තුව 2024 වර්ෂයේදී ඉදිරිපත් කරන ලදි. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ආ) | 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ චක්‍රලේඛය | ව්‍යාපෘති යේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර | වාර්ෂිකව, අභ්‍යන්තර විගණනය විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

විගණන අංශය විසින් ඔවුන්ගේ අදහස් සහ විගණනය කර යෝජනා ප්‍රකාශ කරයි.
නොතිබුණි.

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර කොටසේ පද්ධති පුනරුත්ථාපනය කිරීම හා ජල සැපයුම් පද්ධතිය පුළුල් කිරීම යටතේ කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සියයට 49 සිට සියයට 18 දක්වා අඩු කිරීම සඳහා මීටර 466,165 ක නල ඇතිරීමේ කාර්යයන් සහ දිස්ත්‍රික් මිණුම් කලාප 36 ක නිවාස හිමියන් 62,932 කට සම්බන්ධතා මාරුකිරීමේ අරමුණින් යුතුව ව්‍යාපෘතිය 1 ක්‍රියාත්මක කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තාවට අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 100ක් වුවද, මෙම වාර්තාවේ 3.2 ඡේදයේ සඳහන් පරිදි ව්‍යාපෘති යේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් නොලබන ජල කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ ඉලක්කගත අරමුණු වල ප්‍රගතිය මැනීමට ප්‍රවාහ මිනුම් දත්ත ලබා ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් 383,710.2 ක ආසන්න වශයෙන් රු.මි.115 ක් පමණ වටිනාකමකින් යුත් ඩීඑම්ඡ් මීටර් 36 ක් සවි කර තිබුණි. වසර 3 ක වගකීම් කාලපරිච්ඡේදය ආරම්භ වී වසර දෙකක කාලයක් ගත වූ පසු එම මීටර් ස්ථාපනය කොට තිබුණි. කෙසේ වෙතත්, 2025 අප්‍රේල් 24 වන විට, ඉහත ඩීඑම්ඡ්. මීටර් 36 න් 31 ක් නිෂ්ක්‍රීය වූ බැටරි සහ දෝෂ සහිත දත්ත ලොගර්ස් හේතුවෙන් ක්‍රියාත්මක නොවන තත්ත්වයේ පැවතුනි. ටෙන්ඩර් පිරිවිතරවල වසර පහක බැටරි ආයු කාලයක් නියම කර තිබියදීත්, ඇතැම් මීටර 2022 වසරේ සිට අක්‍රියව පවතින බවද නිරීක්ෂණය විය. කාලීනව අවශ්‍ය පිළියම් ගෙන නොතිබීම හේතුවෙන් මෙහෙයුම් පද්ධතියේ ක්‍රියාකාරීත්වයට බාධා ඇති කර ඇති අතර ව්‍යාපෘති ප්‍රතිඵලවල දිගුකාලීන තිරසාරභාවය සහ ඵලදායීත්වය සම්බන්ධයෙන් සැලකිය යුතු ගැටළු මතු කරයි. | වර්තමානයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක හා නඩත්තු අංශය සමඟ එකතුව නිවැරදි කිරීමේ කටයුතු සිදු කරයි. 2025 මැයි 30 වන විට, ප්‍රවාහ මීටර් 23 ක් ක්‍රියාත්මක වේ. ඉතිරි නිවැරදි කිරීමේ කටයුතු මාසයක් ඇතුළත නිම කිරීමට සැලසුම් කර ඇත. | එම මීටර්වල තිරසාර භාවිතය සඳහා නඩත්තු කටයුතු ක්‍රමානුකූලව ක්‍රියාත්මක කළ යුතු අතර අවසාන ගෙවීම් සිදු කිරීමට පෙර දෝෂ සහිත මීටර්වල අලාභ සැපයුම්කරුගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලිකව රු.මිලියන 7,414.46 ක් වටිනාකමකින් යුත් කොළඹ නගරයේ උතුරු කොටසේ ආ.නො.ජ. අඩු කිරීම සඳහා වූ අයි.සී.බී. 01 පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව, සැලකිය යුතු ලෙස රු.මිලියන 9,528.55 දක්වා වැඩි වී තිබූ අතර, එය මුල් කොන්ත්‍රාත් මුදලට සාපේක්ෂව සියයට 28 ක වැඩිවීමකි. | අවසන් දිස්ත්‍රික් මිනුම් කලාපය පිහිටුවන තෙක් සංශෝධිත නල එළීම් ප්‍රමාණය මෙන්ම සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම පුරෝකථනය කළ නොහැකිය. | සියයට 10 ඉක්මවන ඕනෑම කොන්ත්‍රාත් මිල වැඩිවීමක් සඳහා අදාළ බලධාරීන්ගෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

## 3.3 මතභේදයට තුඩු දෙන ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| අයි.සී.බී 01 කොන්ත්‍රාත්තුවෙන් එකතුව රු.මිලියන 990 ක ප්‍රමාණ බිල් පත්‍ර අයිතමයක් සහ අයි.සී.බී.-02 කොන්ත්‍රාත්තුවෙන් සියයට 14 කට සමාන රු.මිලියන 1,135 ක මුදලක් අගල් නොකපන තාක්ෂණය භාවිතයෙන් නල යෙදීම සහ පයිප්ප රිලයිනින් භාවිතයෙන් පයිප්ප ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කර තිබුණි. ජාතික තරඟකාරී ලංසු ක්‍රමය වෙනුවට ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමය තෝරා ගැනීමේදී අගල් නොකපන තාක්ෂණය භාවිතය තීරණාත්මක සලකා බැලීමක් විය. උසස් නල ඇතිරීමේ සහ පුනරුත්ථාපන තාක්ෂණ හැකියාවන් ගෙන් සමන්විත ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම තීරණය ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම විශේෂිත ක්‍රමවේදයන්හි විශේෂඥතාව ඇති ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන් පමණක් සාමාන්‍යයෙන් ඉහළ පිරිවැය ව්‍යුහයකින් යුතුව ලංසු ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, ලංසු කැඳවීමට පෙර හඳුනාගත හැකිව තිබූ යම් ප්‍රායෝගික ගැටලු මතු වීම හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරණය ඒකපාර්ශ්වික ලෙස අගල් නොකපන තාක්ෂණය අතහැර විවෘත අගල් ක්‍රමය සහ නව නල ප්‍රතිස්ථාපනය කිරීමට තීරණය වී | අධික රථවාහන තදබදය සහ මහජන අපහසුතා වළක්වා ගැනීම සඳහා, ව්‍යාපෘතිය සැලසුම් අදියරේදී අගල් නොකපන ක්‍රමය භාවිතා කිරීමට ව්‍යාපෘතිය තීරණය කරන ලදි. කෙසේ වෙතත්, ක්‍රියාත්මක කිරීමේ අදියරේදී, පුරෝකථනය කළ නොහැකි ඉල්ලුම් වැඩිවීම හේතුවෙන් බොහෝ නල ප්‍රමාණයන් වැඩි කිරීමට අවශ්‍ය වූ බැවින් විවෘත අගල් ක්‍රමය භාවිතා කිරීමට අපට බල කෙරුණි. තවද, ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද ටෙන්ඩර් ලේඛන එම අරමුණ සඳහා පත් කරන ලද තාක්ෂණික ඇගයුම් කමිටුවක් විසින් ඇගයීමට ලක් කරන ලදී. අගල් නොකපන ක්‍රමය වෙනුවට, ව්‍යාපෘතිය ප්‍රමාණ බිල් පත්‍ර අනුපාත භාවිතා කරමින් විවෘත අගල් ක්‍රමය අනුගමනය කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත් මුදල රු.මිලියන 500 ඉක්මවා වෙනස් වී නොමැත. | නිරීක්ෂණය කරන ලද උල්ලංඝනයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

තිබුණි. මෙම වෙනස්කම් මගින් මූලික ලංසු උපාය මාර්ගයට කේන්ද්‍රීය වූ තීරණාත්මක ප්‍රමාණ බිල් පත්‍ර අයිතම විෂය පථයෙන් ඉවත් කර තිබුණි. කොන්ත්‍රාත් මුදලෙන් සියයට 10 ඉක්මවන ප්‍රමාණ බිල් පත්‍ර අයිතම ඉවත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද, මෙම අවස්ථාවේදී රු.මිලියන 500 ඉක්මවීම කොන්ත්‍රාත් විෂය පථයට ප්‍රමාණාත්මක විචලනයක් වන බැවින්, එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඒ වෙනුවට, ව්‍යාපෘති විචලතා කමිටුව විසින් පමණක් එම විචලතා අනුමත කර තිබුණි.

## 3.4 පද්ධති සහ පාලන

| | ගිණුම්කරණ අඩුපාඩු /විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියට අදාළ රු.මිලියන 552 ක වත්කම් ආකෘති පත්‍ර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර මධ්‍යම) විසින් භාර ගෙන තිබුණු අතර ඔහුම ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස එම වත්කම් භාර දී තිබුණි. එසේම එකතුව රු.මිලියන 192 ක වත්කම් භාරදීමේ ආකෘති වල ප්‍රධාන ගණකාධිකාරී හෝ පිරිවැය ගණකාධිකාරීගේ අවශ්‍ය අත්සන් සහ මුද්‍රා නොතිබුණි. ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් නොමැතිකම හේතුවෙන් මෙම තත්ත්වය ව්‍යාපෘතියේ සම්පූර්ණ වත්කම් ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලියේ ලබැදියාවන් අතර ගැටුමක් ඇති කරන බව නිරීක්ෂණය විය. | මෙය තීරණාත්මක ක්‍රියාවලියක් වන අතර කිසිදු අදියරකදී ලබැදියාවන්ගේ ගැටුමක් නොමැත. මෙම ක්‍රියාවලියට අදාළ සහාය ලේඛන අප විසින් විගණනයට ඉදිරිපත් කර ඇත. | ලබැදියාවන්ගේ ගැටුම් ඇති වීම වැළැක්වීම සඳහා වත්කම් භාරදීමේ ක්‍රියාවලිය ස්වාධීන පාර්ශවයක් විසින් මෙහෙයවිය යුතුය. |
| (ආ) | නල මාර්ග ඇතිරීමෙන් සහ කොළඹ මහ නගර සභාවට භාර දීමෙන් වසර තුනක් ගත වී තිබුණද, ව්‍යාපෘතිය විසින් සිදු කරන ලද ඉදිකිරීම් කටයුතු සඳහා ඇපකරයක් ලෙස තැන්පත් කරන ලද රු.109,830,276 ක් වටිනා ආරක්ෂක තැන්පතුව අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි | ව්‍යාපෘතිය විසින් අඛණ්ඩව කොළඹ මහ නගර සභාවෙන් ගෙවීම මුදා හැරීමට ඉල්ලීම් කරන ලදී. කෙසේ වෙතත්, කොළඹ මහ නගර සභාව ඉතා සුළු මුදලක් පමණක් මුදා හැර ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඇප මුදල් අයකර ගැනීමට වහා පියවර ගත යුතුය |